**මඩුල්ල ප්‍රාදේශීය සභාව**
**මොනරාගල දිස්ත්‍රික්කය**

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 30 වැනි දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 ජූලි 6 වැනි දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2016 ජූනි 23 වැනි දින සභාවේ ලේකම්වරයා වෙත යවන ලදී.

**1.2** **මතය**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට මඩුල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.3.1** **ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාව සතු ඉඩම් කැබලි 37 ක වටිනාකම පිළිගත් වෘත්තිය තක්සේරුකරුවකු ලවා තක්සේරු කර ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සභාව සතු මූල්‍ය ප්‍රකාශනවල ගිණුම් ගතකර තිබූ ඉඩම් කැබැලි 6ක වටිනාකම සහ ගොඩනැගිලි 12 ක වටිනාකම පිළිගත් වෘත්තිය තක්සේරු කරුවකු ලවා තක්සේරු කර සාධාරණ වටිනාකම ගිණුම් ගතකර නොතිබුණි.

**1.3.2** **අසම්භව්‍ය බැරකම්**

මකුල්ල බස්නැවතුම්පලේ කඩකාමර සම්බන්ධයෙන් මොනරාගල දිසා අධිකරණයේ සභාවට එරෙහිව පවරා ඇති නඩු අංක 1618 නඩුව සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර කර නොතිබුණි.

**1.3.3** **නොසැසඳූ පාලන ගිණුම්**

ගිණුම් විෂයන් 06 කට අදාලව මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන්ගේ එකතුව රු. 9,887,533 ක් වූ අතර උපයෝගි ලේඛන අනුව ශේෂය රු. 10,022,780 ක් විය.

### 1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

----------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා රු. 60,268,860 ක වත්කම් විෂයක් සහ රු. 283,271 ක වගකීම් විෂයයක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණ කිරීමට නොහැකිවිය.

### 1.3.5 නීති,රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම

----------------------------------------

පහත දැක්වෙන නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | **ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි**<br>මු.රෙ. 71 | 2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛට පටහැනිව සභාවේ අනියම් හා ආදේශක පදනම මත සේවය කළ රියදුරු, යන්ත්‍ර ක්‍රියාකරු, මුරකරු, සෞඛ්‍ය කම්කරු පුස්තකාල භාරකරු, මාර්ග කම්කරු යන තනතුරු සඳහා සේවකයින් 28 දෙනෙකු අනුමත කාර්යය මණ්ඩලයට පිටින් ස්ථිර පත්වීම් ලබාදී තිබුණි. |
| (ආ) | 2003 අංක 17 දරන පනතින් සංශෝධිත 1942 අංක 18 දරන රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල් ආඥා පනත | විශ්‍රාම වැටුප් රහිත තාවකාලික, මාසිකව වැටුප් ලබන සේවකයින්ගෙන් සියයට 8ක් හා සභාවේ දායකත්වය සියයට 12 ක් වන පරිදි රාජ්‍ය සේවක අර්ථ සාධක අරමුදලට දායක මුදල් යැවිය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ සභාව විසින් අනියම් පදනම මත සේවය කල රියදුරකු වෙනුවෙන් සේවක අර්ථසාධක අරමුදල් හා සේවා නියුක්තියන්ගේ භාරකාර අරමුදලට දායක මුදල් වශයෙන් 2015 ජනවාරි සිට අප්‍රේල් දක්වා රු.29,614 ක් ගෙවීම් කර තිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 4,262,414 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 2,728,319 ක් වුයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ ශුද්ධ වැඩිවීම රු. 1,534,095 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**--------------------**

**2.2.1 හිඟ ආදායම්**

----------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 හා 159 වගන්තිවල විධිවිධාන අනුව සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු. 534,204 ක් වූ හිඟ ආදායම් අයකර ගෙන නොතිබුණි.

**2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

**------------------------------**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.689,420 ක මුදලක් සහ මුද්දර ගාස්තු වෙනුවෙන් රු.1,422,823 ක මුදලක් අයකර ගැනිමට තිබුණි.

**2.2.3 දුරකථන කුළුණු ගාස්තු**

**----------------------------**

විවිධ දුරකථන සමාගම් විසින් සභා බල ප්‍රදේශයේ ස්ථාපිත කර තිබූ සම්ප්‍රේෂණ කුළුණු 6 ක් සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වගන්තියේ විධිවිධාන අනුව වාර්ෂික බද්දක් සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් අය කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.3 අධිභාර**

**--------**

1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ විධි විධාන ප්‍රකාරව වගකිව යුතු අයවළුන්ට එරෙහිව මා විසින් ඉකුත් වර්ෂයන් තුළදී පනවන ලද අධිභාර සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.32,697 ක මුදලක් අයකර ගැනීමට තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

---

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

---

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) තනතුරු 9 කට අදාලව අනුමත සේවක සංඛ්‍යාවට වඩා සේවකයින් 34 දෙනෙකු සමාලෝචිත වර්ෂයේදි යොදවාගෙන වැටුප් හා දීමනා ගෙවා තිබුණි.

(ආ) විදුලිබල අමාත්‍යාංශ ලේකම්ගේ 2010 අගෝස්තු 17 දිනැති ලිපියේ 2(1) වගන්තිය ප්‍රකාරව වීථි ලාම්පු ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කිරීම සඳහා ගාස්තු ගෙවීමේ පදනම මත පළාත් පාලන ආයතන වීථි පහන් ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කිරීම සඳහා සේවා සැපයුම්කරුවෙකු ලෙස කටයුතු කළ යුතු වුවත්, එසේ සිදු නොකර සමාලෝචිත වර්ෂයේදී මේ සඳහා සභා අරමුදලෙන් රු. 439,500 ක වියදමක් දරා තිබුණි.

(ඇ) 2013 නොවැම්බර් 08 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ අංක 12/භා/05/කසල බඳුන් දරන ලිපිය මඟින් ලීටර් 20 ප්‍රමාණයේ කසල බඳුන් 100 ක් සභාවට 2013 නොවැම්බර් 8 දින ලබා දී තිබුණද 2016 මැයි 06 දින වන විටත් කසල බඳුන් 93 ක් නිකුත් නොකර ගබඩාවේ රඳවාගෙන තිබුණි.

### 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

---

ඍජු ශ්‍රම පදනම මත සභාව විසින් රු. 1,256,981 ක් වැය කර කර්මාන්ත 8ක් සමාලෝචිත වර්ෂයේදි නිමකර තිබුණද, ඒ සඳහා ඇස්තමේන්තු, ද්‍රව්‍ය පිරිවැය විශ්ලේෂණ සහ නිමි වැඩ වාර්තා සකස් කර නොතිබුණි.

## 4. යහපාලනය හා ගිණුම් කටයුතු භාවය

---

### 4.1 අයවැය පාලනය

---

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සභාව විසින් පිළියෙල කර තිබූ අයවැය ලේඛනය මඟින් ඇස්තමේන්තු කළ ආදායම්, වියදම් අතර පෙන්නුම් කෙරෙන සැලකිය යුතු විචලනයන් අනුව ආදායම් හා වියදම් පාලනයේදී අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

## 4.2 පාරිසරික හා සමාජ වගකීම් ඉටුකිරීම

සෑම රාජ්‍ය ආයතනයකම සිය දැක්ම හා මෙහෙවර ඉටුකර ගැනීමේ කාර්යයේදී එකී ආයතනයනට අදාල පාරිසරික හා සමාජ වගකීම් හඳුනාගෙන ඒවා ඉටුකිරීම සඳහා උපක්‍රම අනුගමනය කළ යුතු වුවත්, සභාව විසින් ඔවුන්ගේ පාරිසරික හා සමාජ වගකීම හඳුනාගැනීම සඳහා වූ ක්‍රමවේදයක් සකස් කර ක්‍රියාත්මක කර නොතිබුණි.

## 4.3 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

සමාලෝචිත වර්ෂය සඳහා සභාව විසින් වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

## 4.4 අභ්‍යන්තර විගණනය

පළාත් සභාවේ අභ්‍යන්තර විගණන ඒකකය මඟින් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

## 4.5 විගණන හා කළමනාකරණ කමිටු

2009 ජුනි 9 දිනැති කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අංක කළමනාකරණ විගණන චක්‍රලේඛ DMA/ 2009 (01) දරන අභ්‍යන්තර විගණන මාර්ගෝපදේශ චක්‍රලේඛය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීමට සමාලෝචිත වර්ෂය වන විටත් කටයුතු කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලනය

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අභ්‍යන්තර පාලනය

(ඇ) ආදායම් පරිපාලනය